# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1713/16 - 2011 ජූලි 07 වැනි බ්‍රහස්පතින්දා - 2011.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස — පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 2011 අංක 02 දරන වයඹ පළාත් පාරිසරික (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2011 මැයි මස 19 වැනි දින සම්මත කරන ලදුව, 2011 ජුනි මස 22 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2011 ජුනි මස 27 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

**වයඹ පළාත් සභාව**

**1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :

1. මේ ප්‍රඥප්තිය 2011 අංක 02 දරණ වයඹ පළාත් පාරිසරික (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 1 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

1. 1990 අංක 12 දරණ වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යනුවෙන් මෙම ප්‍රඥප්තිය හඳුන්වනු ලැබේ. මෙහි මින්මතු "විෂය භාර අමාත්‍යවරයා" ලෙසද හඳුන්වනු ලබන පළාත් පරිසර විෂයභාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන ගැසට් නිවේදනයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඉ) ඡේදය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : ප්‍රධාන ප්‍රඥප්තියේ 3(1)(ඉ) වැනි වගන්තිය සංශෝධනය කිරීම.

(ඉ) පළාත් අධිකාරියේ සභාපතිවරයා විසින් එහි ලේකම්වරයා වශයෙන් තත් කාලයේ අධිකාරියේ අධ්‍යක්ෂවරයා පත් කළ යුතු ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වැනි වගන්තියෙහි (1) වැනි උපවගන්තියෙහි "පොදු සංවිධාන" යන වචන වෙනුවට "පොදු විධිවිධාන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 10(1) වැනි වගන්තිය සංශෝධනය කිරීම.

"පළාත් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා හා ප්‍රධාන පරිපාලන නිලධාරියා"

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ : ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තිය සංශෝධනය කිරීම.

11. (1) අංක 03 (1) (ඈ) වගන්තිය අනුව පත්කරන ලද සභාපතිවරයා, පළාත් අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර අධ්‍යක්ෂවරයා පළාත් අධිකාරියේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විය යුතු ය.

(2) (අ) පළාත් අධිකාරියේ කටයුතු මෙහෙයවීම, පළාත් අධිකාරියේ බලතල හා කාර්යයන් සංවිධානය හා ක්‍රියාත්මක කිරීම ද, පළාත් අධිකාරියේ සේවා නියුක්තයන්ගේ පරිපාලනය හා පාලනය ද, සභාපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව පළාත් අධිකාරියේ අධ්‍යක්ෂවරයා වෙත භාරවිය යුතු ය.

(ආ) පළාත් අධිකාරිය විසින් 12 (1) වගන්තියෙන් නියම කරනු ලබන සුදුසුකම් හා සේවා කොන්දේසි මත පාරිසරික කටයුතු පිළිබඳ මනා නිපුණත්වයක් හා පාරිසරික විෂය පිළිබඳ අධ්‍යාපනික සුදුසුකම් ඇති අයෙකු පළාත් අධිකාරියේ අධ්‍යක්ෂ ලෙස පළාත් අධිකාරිය විසින් බඳවා ගත යුතු ය.

(ඇ) ඒ සඳහා පළාත් අධිකාරිය විසින් 12(2) වගන්තිය යටතේ නියම කරනු ලබන සුදුසු වේතනයක් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

(ඈ) පළාත් අධිකාරියේ අධ්‍යක්ෂවරයාට පළාත් අධිකාරියේ රැස්වීම්වලට සහභාගිවීමේ හිමිකම ඇති නමුත් එහි රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකමක් ඔහුට නොවිය යුතු ය.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වැනි වගන්තිය හා 18 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 17, 18 වැනි වගන්තිය ඉවත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ : ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වැනි වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නේ යම් කටයුතු සම්බන්ධයෙන් ද ඒ කටයුතු අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු බව."

20. (1) දූෂණයට මග සලසමින් පරිසරයට අපද්‍රව්‍ය නිකුත් කිරීමක්, තැන්පත් කිරීමක් හෝ පිටමං කිරීමක් හෝ පරිසර දූෂණය හෝ ශබ්ද දූෂණය සිදු කෙරෙන කටයුතු වන්නා වූ ද (මෙහි මින් මතු "නියමිත කටයුතු" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට නියමිත ව ඇත්තා වූ ද කටයුතු අවස්ථාවෝචිත පරිදි ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් පරිසර විෂය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) කිසිම තැනැත්තකු විසින් –

(අ) පළාත් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ ;

සහ

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති හා වෙනත් උපමානවලට අනුකූලව හැර, යම් නියමිත කටයුත්තක් කරගෙන යනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වැනි උපවගන්තිය කඩ කරමින් යම් නියමිත කටයුත්තක් කරන සෑම තැනැත්තෙකු ම, වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට –

(අ) රුපියල් දස දහසකට නොඅඩු දඩයකට හෝ එක් වර්ෂයකට නොඅඩු කාලයකට බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත්විය යුතු ය.

(ආ) අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් ඇතුළත (2) වැනි උපවගන්තිය යටතේ වූ බලපත්‍රයක් ලබාගත යුතු ය.

(4) (3) වැනි උපවගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු, ඒ උපවගන්තිය යටතේ අධිකරණය විසින් නිශ්චය කරනු ලබන කාලය ඇතුළත බලපත්‍රයක් ලබා නොගෙන නියමිත කටයුත්ත නොකඩවා කරගෙන යන අවස්ථාවක එය වසා දැමීම සඳහා පළාත් අධ්‍යක්ෂ විසින් හෝ ඒ සඳහා පළාත් අධ්‍යක්ෂ විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත (2) වැනි උප වගන්තිය යටතේ ඒ තැනැත්තා බලපත්‍රයක් ලබාගෙන එසේ ලබාගත් බලපත්‍රයේ පිටපත අධිකරණයට ඉදිරිපත් කරනතුරු, කර්මාන්තශාලාව හෝ ඒ නියමිත කටයුත්ත කරගෙන යනු ලබන ස්ථානය වසා දැමිය යුතු යයි අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකිය.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 (1) උපවගන්තියේ (ආ) ඡේදයෙහි "දින පහක්" යන වචන වෙනුවට "දින තිහක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ (1)(ආ) වැනි වගන්ති සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වැනි වගන්තියේ අර්ථ නිරූපණයන් හි "විෂය භාර අමාත්‍යවරයා" යන්නෙහි අර්ථ නිරූපණය සඳහා දී ඇති "පළාත් පාලන විෂය භාර අමත්‍යවරයා" යන වචන වෙනුවට "පළාත් පරිසර විෂය භාර අමාත්‍යවරයා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තියෙහි එම ඡේදය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, අර්ථ නිරූපණ.

"ලේකම්වරයා" යන්න සඳහා දී ඇති අර්ථ නිරූපණය ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට "ලේකම්වරයා" යන්නෙන් "පළාත් පරිසර අධිකාරියේ ලේකම්වරයා" අදහස් වේ.

10. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

07-538